# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2262/44 - 2022 ජනවාරි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**මුද්‍රණ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

136 වැනි අධිකාරය වන පඩිපාලක සභා ආඥාපනතේ විධිවිධාන ප්‍රකාර, මුද්‍රණ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව මගින් සම්මත කරනු ලැබ ගරු කම්කරු අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද එකී තීරණයන් පහත උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට පඩිපාලක සභා ආඥාපනතේ 29 (3) වන වගන්තියෙහි විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2021 දෙසැම්බර් මස 15 දින සිට වලංගු විය යුතුය.

**එම්. පී. ඩී. යූ. කේ. මාපා පතිරණ,**
ලේකම්,
කම්කරු අමාත්‍යාංශය.

2022 ජනවාරි මස 07 වැනි දින,
කොළඹ 05,
"මෙහෙවර පියස" දී ය.

***උපලේඛනය***

මුද්‍රණ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1945 ජූලි මස 31 වැනි දින අංක 9441 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, වරින් වර වෙනස් කරන ලද්දා වූ ද අවසන් වරට 2018 ජූලි 16 දින අංක 2080/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දා වූ එකී II වන කොටස වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.


1A - G 35823 -25 (2022/01)



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

*II වැනි කොටස*

**කම්කරුවන්ගේ පංතිය**

*"ඒ" පංතියේ කම්කරුවන්:-*

ප්‍රොසෙස් ආටිස්වරු, ප්‍රොසෙස් කැමරා ඔපරේටර්වරු, ප්‍රොසෙස් එචර්වරු, ප්‍රොසෙස් හැන්ඩ්ස්, ලිතෝ ආටිස්වරු, ලිතෝ සහ ඕෆ්සෙට් මැෂින් මයින්ඩර්වරු, රොටරි මයින්ඩර්වරු, පොටෝග්‍රැෆිර්ස් හා රොටාග්‍රැනෝ මැෂින් මයින්ඩර්වරු, ටින් ප්ලේට් ප්‍රින්ටර්වරු, ෆිල්ම් සෙටර්වරු, ලයිනෝටයිප් ඔපරේටර්වරු, මොනෝ ටයිප් කී බෝඩ් ඔපරේටර්වරු, ලඩ්ලෝ ඔපරේටර්වරු, ලයිනෝ ටයිප් මිකැනික්වරු, මුද්‍රණ යන්ත්‍ර මිකැනික්වරු, ප්‍රොසෙස් එන්ග්‍රේවර්වරු, මවුන්ටර්වරු, ප්‍රොසෙස් ප්‍රින්ටර් ඩවුන්වරු, ලිතෝ ට්‍රාන්ස්පර්වරු, ලිතෝ පෲෆර්වරු, මවුත්ශෝධ්‍ය පත් කියවන්නන්, (පුවත් පත් නිෂ්පාදනයේ නිරත වූවන් හැර)

*"බී" පංතියේ කම්කරුවන්:-*

මොනෝ ටයිප් කාස්ටර් යන්ත්‍ර ක්‍රියාකරුවන් (ඇටෙන්ඩන්ට්වරු) සුපර් කාස්ටර් යන්ත්‍ර ඇටෙන්ඩන්ට්වරු, එල්රොඩ් මැෂින් ඔපරේටර්වරු, වර්ණයෝජකයෝ, ස්ටෝන් හැන්ඩ්වරු සහ ඉම්පෝසිං හැන්ඩ්වරු, ප්‍රෙස්මන්වරු ලෙටර් ප්‍රෙස් සිලින්ඩර් මැෂින් මයින්ඩර්වරු සහ පෝෂකවරු, සිල්ක් ස්ක්‍රීන් මැෂින් ඔපරේටර්වරු, රබර් මුද්‍රා සාදන්නෝ, රිලීෆ් ස්ටැම්ප්වරු සහ ඩයිප්ස්ටැම්ප් මැෂින් ඔපරේටර්වරු, බයින්ඩර්වරු, බයිංඩිං මැෂින් ඔපරේටර්වරු, මසන යන්ත්‍ර ඔපරේටර්වරු, නවන යන්ත්‍ර ඔපරේටර්වරු, ඔපරේටර්වරු, කාටුන් කැපීමේ සහ ඇලවීමේ මැෂින් ඔපරේටර්වරු.

ඔපරේටර්වරු, කපන්නෝ (අතින් සහ යන්ත්‍රයෙන්) ගිලටින් මැෂින් ඔපරේටර්වරු සහ ගිල්ඩර්වරු, රූල් ගසන්නෝ (අතින් සහ යන්ත්‍රයෙන්) ස්ටිරියෝ ටයිප්වරු, මැන්ගල්වරු, පවුන්ඩ්‍රිමන්වරු, පවුන්ඩර් තහඩුවත්කරන්නෝ, අකුරුවත් කරන්නෝ, ප්ලේටින් මැෂින් මයින්ඩර්වරු (සම්පූර්ණ ස්වයංක්‍රියාකාරී යන්ත්‍ර ක්‍රියාකරුවන්) රෝලර් වත් කරන්නෝ (රෝල් වත් කිරීමේ තුවක්කුව පාවිච්චි කිරීමෙන්), ප්ලේටින් මැෂින් මයින්ඩර්වරු (හැන්ඩ් ෆීඩ්), රෝලර් වත් කරන්නෝ (අතින්)

*"සී" පංතියේ කම්කරුවන්:-*

ෆවුන්ඩර් ප්ලේට් විපර්වරු, ෆවුන්ඩ්රි කම්කරුවෝ. රොටර් කම්කරුවෝ. අසුරන්නෝ, ගණන් කරන්නෝ සහ හරි වැරදි බලන්නෝ.

**"ඩී" පංතියේ කම්කරුවන්:-** වයස අවුරුදු 18ට නොඅඩු නුපුහුණු කම්කරුවෝ.

**"ඊ" පංතියේ කම්කරුවන්:-** වයස අවුරුදු 18ට අඩු නුපුහුණු කම්කරුවෝ.

**"එෆ්" පංතියේ කම්කරුවන්:-** මුරකරුවෝ

**වැඩ ඉගෙනගන්නන් හා වැඩ පුහුණුවන්නන් නොවූ කම්කරුවන්ට මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය.**

| *සේවා වර්ෂය* | *"ඒ" පංතිය රු. ශත* | *"බී" පංතිය රු. ශත* | *"සී" පංතිය රු. ශත* | *"ඩී" සහ "එෆ්" පංතිය* | *"ඊ" පංතිය* |
|---|---|---|---|---|---|
| | | | | *රු. ශත* | *රු. ශත* |
| 1 වසර | 14,450.00 | 13,962.50 | 13,475.00 | 12,987.50 | 12,500.00 |
| 2 වසර | 14,650.00 | 14,137.50 | 13,625.00 | 13,112.50 | 12,600.00 |
| 3 වසර | 14,850.00 | 14,312.50 | 13,775.00 | 13,237.50 | 12,700.00 |
| 4 වසර | 15,050.00 | 14,487.50 | 13,925.00 | 13,362.50 | 12,800.00 |
| 5 වසර | 15,250.00 | 14,662.50 | 14,075.00 | 13,487.50 | 12,900.00 |
| 6 වසර | 15,450.00 | 14,837.50 | 14,225.00 | 13,612.50 | 13,000.00 |
| 7 වසර | 15,650.00 | 15,012.50 | 14,375.00 | 13,737.50 | 13,100.00 |
| 8 වසර | 15,850.00 | 15,187.50 | 14,525.00 | 13,862.50 | 13,200.00 |
| 9 වසර | 16,050.00 | 15,362.00 | 14,675.00 | 13,987.50 | 13,300.00 |
| 10 වසර | 16,250.00 | 15,537.50 | 14,825.00 | 14,112.50 | 13,400.00 |

| සේවා වර්ෂය | "ඒ" පංතිය රු. ශත | "බී" පංතිය රු. ශත | "සී" පංතිය රු. ශත | "ඩී" සහ "එෆ්" පංතිය | "ඊ" පංතිය |
|---|---|---|---|---|---|
| 11 වසර | 16,450.00 | 15,712.50 | 14,975.00 | 14,237.50 | 13,500.00 |
| 12 වසර | 16,650.00 | 15,887.50 | 15,125.00 | 14.362.50 | 13,600.00 |
| 13 වසර | 16,850.00 | 16,062.50 | 15,275.00 | 14,487.50 | 13,700.00 |
| 14 වසර | 17,050.00 | 16,237.50 | 15,425.00 | 14,612.50 | 13,800.00 |
| 15 වසර | 17,250.00 | 16,412.50 | 15,575.00 | 14,737.50 | 13,900.00 |

**වැඩ ඉගෙන ගන්නෝ සහ වැඩ පුහුණුවන්නෝ**

| සේවා වසර | "ඒ" පංතිය රු. ශත | "බී" පංතිය රු. ශත | "සී" පංතිය රු. ශත |
|---|---|---|---|
| 1 වසර | 10,000.00 | 9,662.50 | 9,312.50 |
| 2 වසර | 10,150.00 | 9,787.50 | 9,412.50 |
| 3 වසර | 10,300.00 | 9,912.50 | 9,512.50 |
| 4 වසර | 10,450.00 | 10,037.50 | 9,612.50 |
| 5 වසර | 10,600.00 | 10,162.50 | 9,712.50 |

EOG 1 - 0144

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.